සියළුම හිමිකම් ඇවිරිණි]
*All Rights Reserved ]*

# පාසල් වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය

II පත්‍රය

නැණ ලොවට පා නඟන හපනුන්ට මඟ කියන

## "අදිති"

11

පැය 01 යි මිනි 15

විභාග අංකය ..............................

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- පිළිතුරු 3 ක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

**01. ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

'' වැස්ස නැති හැමදාක ම ලොකු අම්මා පොල් ලෙලි තැළීමට ගියා. තළන ලද ලෙලි කොහු වුණාට පසු ලොකු අම්මා ඒවා ගෙනැවිත් මිදුලේ දමා වේළා ගත්තා. වේළුණු කොහු නෙළීමෙන් ඇ හදාගත්තේ මිදුල මැද රන්වන් කොහු වලාකුළක්. ඒ වලාකුළේ මම පෙරළි පෙරළි සෙල්ලම් කළේ පූස් පැටවකු මෙන් නිදහසේ. වෙලාවකට මට හිතුණා ඒ රන්වන් කොහු යෝධ සීයා කෙනෙකුගේ රැවුළක් දෝ කියලා''.

1. වැස්ස නැති දිනවල ලොකු අම්මා ගියේ කොහාට ද? ......................................
2. කොහු ලබා ගත්තේ මොනවායින් ද? .........................................................
3. රන්වන් කොහු උපමා කර ඇත්තේ කුමකට ද? ............................................
4. වර්ෂාව යන්නට සමාන පදයක් ඡේදයෙන් සොයා ලියන්න. ..............................
5. ලොකු අම්මා කොහු වේළෙන්න දැමුවේ කොහාට ද? ......................................
6. මහප්‍රාණ අක්ෂරයක් යෙදුණු වචනයක් ඡේදයෙන් සොයා ලියන්න. ........................
7. කෙටිවක් පාපිල්ල අගට යෙදුණු වචනයක් සොයා ලියන්න. ..............................
8. ''ඕ'' ශබ්දය යෙදුණු වචනයක් ඡේදයෙන් සොයා ලියන්න. .................................

(1x8=8)

**02. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.**

1. වලලු / වළලු
2. නළල / නලල

(1x2=2)

**03. පහත සඳහන් වැකිවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.**

1. ………………….. (අපි / අප) නියර දිගේ යමු.
2. තුරු ලතා සුළඟින් ඒ මේ අත …………………. (පැද්දෙයි / පැද්දෙති)

(1x2=2)

**04. පහත යෙදුම්වල අදහස ලියන්න.**

1. මුරුංගා අත්තේ තියනවා - ……………………………………………………………
2. ඇහැගහගෙන ඉන්නවා - ……………………………………………………………

(1x2=2)

**05. පහත වචන නිවැරදි ව ගළපා වැකි සකස් කරන්න.**

1. නිහැඬියාව / ගීතය / කුරුලු / මැකී / යයි / වනයේ / නිසා

   ………………………………………………………………………………………

2. පැමිණ / ජවනිකාවටයි / සිටින්නේ / අප / අවසාන / දැන්

   ………………………………………………………………………………………

(1x2=2)

**06. සුදුසු තැන්හි විරාම ලකුණු යොදන්න.**

1. මැදැහිල්ල තමයි ලොක්කා නංගි උත්තර දුන්නා
2. සීයේ සීයේ අදත් කතන්දරයක් කියන්නකෝ නංගි අයැද සිටියා ය

(1x2=2)

**07. පහත තුන් තේරවිලි තෝරන්න.**

1. ගොහොරු වේල්ල

   ………………………………………………

   ………………………………………………

   ………………………………………………

   ………………………………………………

2. ගජ නාලය

   ………………………………………………

   ………………………………………………

   ………………………………………………

   ………………………………………………

(1x2=2)

**08. පහත ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කරන්න.**

1. …………………….. මිරිස් ගත්තා වගේ
2. ………………….…………….. රත්තරන් බැන්දා වගේ.

(1x2=2)

**09. යුගල පද සම්පූර්ණ කරන්න.**

1. …………….. සෙල්ලම්
2. තෑගි ………………..

(1x2=2)

**10. දී ඇති වැකියේ සිංහල අර්ථය ලියන්න.**

I have a one brother - ……………………………………………………………………

(1x1=1)

**11. ඉංග්‍රීසි වචනවල සිංහල අර්ථය ලියන්න.**

1. Children - ………………………..
2. Mosque - ……………………….. (1x2=2)

**12. පහත දී ඇති වැකිය දෙමළ බසට හරවා සිංහලෙන් ලියන්න.**

අර පොත දෙන්න. - ……………………………………………………………………

(1x1=1)

**13.** **දෙමළ වචනවල සිංහල තේරුම ලියන්න.**

1. වහුප්පු - ……………………………………….
2. කළුවුංගල් - ……………………………………….

(1x2=2)

**14.** " සුන්දර දිය ඇල්ලක් " යන මාතෘකාව යටතේ අර්ථවත් වාක්‍ය තුනක් ලියන්න. එක් වාක්‍යයක වචන පහකවත් අවම වශයෙන් තිබිය යුතු ය. උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි විය යුතු ය.

1. ………………………………………………………………………………………
   ……………………………………………………………………………………
2. ………………………………………………………………………………………
   ……………………………………………………………………………………
3. ………………………………………………………………………………………
   ……………………………………………………………………………………

(2x3=6)

- **පිළිතුරු සපයන්න.**

**15.** ''19 899'' ට එකක් වැඩි සංඛ්‍යාව අකුරෙන් ලියන්න.

………………………………………………………………………………………

**16.** 12 ට 7ක් එකතු කළ විට ලැබෙන පිළිතුර රෝම ඉලක්කමෙන් ලියන්න. ………………………


**17.** රටාවේ ඊළඟ සංඛ්‍යා දෙක හිස්තැන මත ලියන්න.


6 050, 6 035, 6 020, ……………. , ……………….


**18.** තාත්තාගේ මාසික වැටුප රුපියල් 8 500කි. අම්මාගේ වැටුප එමෙන් තුන් ගුණයකට වඩා රුපියල් දහසක් අඩු ය. දෙදෙනාගේ මාසික වැටුප්වල එකතුව කීය ද?

……………………………………

**19.** පහත සඳහන් C හා D ලී පටි දෙක යොදා තැනූ ලී රාමුවක් රූපයේ දැක්වේ. එම ලී රාමුවේ වටේ දිග සොයන්න.





වටේ දිග …………....

**20.** මාළු කුරියෙකුගේ බර 3kg 250g වේ.

i) එම මාළුවාගේ බර ග්‍රෑම් වලින් දක්වන්න.

ii) මාළු ග්‍රෑම් 250ක මිල රුපියල් 225ක් නම් මාළු කුරියාගේ මිල කීයද ?


**21.**



1. රූපයේ ඇති ත්‍රිකෝණ ගණන
= ……………………
2. රූපයේ ඇති චතුරස්‍ර ගණන
= …………………….

**22.** බස් රථයක් ප.ව. 4.15ට ගමන් ආරම්භ කර පැය 5.40කින් ගමනාන්තයට ළඟා විය. ගමනාන්තයට ළඟා වූ වේලාව පැය 24 ඔරලෝසුවෙන් දක්වන්න. ……………………………

**23.**



1.මෙම ඝනවස්තුවේ සිරස් තල කීය ද?
…………………………..
2.මෙහි දාර කීය ද? ……………………………

**24.**

| | |
|---|---|
| 275 | 80 |
| 324 | 139 |

කොටුව තුළ ඇති සංඛ්‍යාවලින් සංඛ්‍යා දෙකක් එකතු කළ විට 404 ලැබේ. එම සංඛ්‍යා දෙක තෝරා ලියන්න.

…………………….. , …………………………


**25.** ළමයෙක් A නම් ස්ථානයේ සිට 5kmක් බස්නාහිර දිශාවට ගමන් කර 5kmක් උතුරු දිශාවට ගමන් කර B නම් ස්ථානයේ නවතියි. A පිහිටා ඇත්තේ B සිට කුමන දිශාවෙන් ද?

……………..……………

**26.** රුපියල් 500 නෝට්ටු මිටියක අංක සඳහන් ව ඇත්තේ අනුපිළිවෙළට ය. උඩින් ම සඳහන් නෝට්ටුවේ අංකය 2362 ය. යට ම නෝට්ටුවේ අංකය 2373 ය. එම මුදල් නෝට්ටු මිටියේ ඇති ඇති මුදල්වල වටිනාකම රුපියල් කීය ද? ……………………………………………

**27.** උත්සවයක් සඳහා සකස් කළ පලතුරු බීම භාජනයකින් ලීටර 6 යි මිලිලීටර 250ක් ඉවත් කළ පසු, ඉතිරි වූ පරිමාව ලීටර 12 යි මිලිලීටර 475කි. භාජනයේ මුලින් තිබූ පලතුරු බීම පරිමාව කොපමණ ද? ……………..……………


**28.**



රූපයෙහි $\frac{2}{10}$ ක් අඳුරු කර ඇත.


1. මෙහි පාට නොකළ කොටසින් $\frac{1}{4}$ ක් අළුතින් අඳුරු කරන්න.

2. එවිට අඳුරු කර නොමැති කොටස දශම සංඛ්‍යාවක් ලෙස දක්වන්න.

**29.** 


මෙම මාර්ග සිතියමට අනුව ගල්ගමුවේ සිට වාරියපොළට දුර කොපමණ ද? .....................

**30.** කම්බියක් නවා සාදාගත් සෘජුකෝණාස්‍රයක් පහත දැක්වේ. එය දිගහැර සමචතුරස්‍රයක් නිර්මාණය කළේ නම්, එහි පැත්තක දිග කොපමණ ද? ..........................................




(2x16=32)

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

**31.** සූර්ය නමස්කාරයේ නිවැරදි ක්‍රියාකාරකම් ගණන වනුයේ,

1. 12කි    2. 13කි    3. 11කි

**32.** වාෂ්පයෙන් තම්බා ගන්නා ආහාරයකි.

1. ආප්ප    2. ඉඳිආප්ප    3. මුං කැවුම්

**33.** ජීවන චක්‍රයක් ඇති සතෙකු නොවන්නේ,

1. මදුරුවා    2. බල්ලා    3. සමනලයා

**34.** දෙහි කල් තබා ගැනීමට අතීතයේ භාවිත නොකළ ක්‍රමයකි.

1. ශීතකරණයේ තැබීම    2. ලුණු දෙහි දැමීම    3. වැලි යට දැමීම


**35.** ගෝලයක් නොවන බෝලයක් භාවිත කරන ක්‍රීඩාවකි.

1. ක්‍රිකට්    2. රගර්    3. වොලිබෝල්

**36.** ත්‍රිවීල් සහ යතුරුපැදි ධාවනය කිරීමට ඉඩ ලබානොදෙන මාර්ග පද්ධතියකි.


1. අධිවේගී මාර්ග    2. A ශ්‍රේණියේ මහා මාර්ග    3. කොන්ක්‍රීට් මාර්ග

**37.** පහත රූපයේ දැක්වෙන උපකරණය යොදාගෙන ජලය ලබාගනු ලබන දිස්ත්‍රික්කයකි.



1. අනුරාධපුරය
2. මහනුවර
3. යාපනය

**38.** මෙම දී ඇති පින්තූරය මගින් පෙන්නුම් කරනුයේ,




1. ජලය සිසිල් වේ.
2. රත්වීමේ දී ජලය වාෂ්ප වේ.
3. ජලය රත්වන බව

**39.** මස්, මාළු ආහාරයට ගැනීමෙන් අපට ලැබෙන පෝෂ්‍ය පදාර්ථය වනුයේ,

1. කාබෝහයිඩ්‍රේට්     2. යකඩ     3. ප්‍රෝටීන්

**40.** ධීවර කර්මාන්තයේ දී වඩදිය යනුවෙන් හඳුන්වනුයේ,

1. මුහුදු රළ පහළ යාම     2. මුහුදු රළ ඉහළ යාම     3. මුහුදු රළ ගොඩගැලීම

**41.** වර්තමානයේ පවතින වෛරස් රෝගයෙන් ආරක්ෂා වීමට භාවිත කරනු ලබන පැළඳුමකි.

1. ඒප්‍රණයක්     2. සබන්     3. මුහුණු ආවරණය

**42.** ශ්‍රී ලංකාවේ පිහිටීම සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වනුයේ,

1. ඉන්දියාවට උතුරින් ඉන්දියන් සාගරයේ පිහිටි දූපතකි.
2. ඉන්දියාවට දකුණින් ඉන්දියන් සාගරයේ පිහිටි දූපතකි.
3. මැලේසියාව, සිංගප්පූරුව වැනි රටවලට නැගෙනහිරින් පිහිටි දූපතකි.

**43.** මෙම උපකරණය භාවිත කරනු ලබන්නේ,



1. ඇණ ගැසීමට
2. යකඩ තැලීමට
3. ඇණ ගැසීමට හා ඇණ ගැලවීමට


**44.** කුඹල් කර්මාන්තයේ දී භාවිත කරන උපකරණයක් වන්නේ,

1. මයිනහම     2. සකපෝරුව     3. කිණිහිරය

**45.** ශ්‍රී ලංකාව සම්පූර්ණයෙන්ම යටත් කරගත් බටහිර ජාතිය වන්නේ,

1. ලන්දේසීන්     2. චීන්නුන්     3. ඉංග්‍රීසින්

**46.** මෙම උපකරණය මගින් කෙරෙන කාර්යය වන්නේ,



1. සුළඟේ වේගය මැනීම
2. සුළං හමන දිශාව දැන ගැනීම
3. සුළඟ පාවෙන බව දැන ගැනීම

**47.** ''මඟුල් කෑම'' පොතේ රචකයා වනුයේ,

1. ටී.බී. ඉලංගරත්න මහතා
2. කුමාරතුංග මුනිදාස මහතා
3. මාර්ටින් වික්‍රමසිංහ මහතා


**48.** කාල නියමයක් නොමැති ව මල් පිපෙන ශාකයකි.

1. එරබදු 2. අරලිය 3. ඕකිඩ්

**49.** වර්ෂාපතනය මැනීමේ දී භාවිත කරනු ලබන නිවැරදි මිනුම් ඒකකය වනුයේ,

1. මිලි මීටර් 2. මිලි ලීටර් 3. සෙන්ටිමීටර්

**50.** මෙම සංගීත භාණ්ඩය නම් කරන්න.



1. තම්මැට්ටම
2. දවුල
3. ගැටබෙරය

**51.** තැපැල් කාර්යාලයකින් සිදුනොවන සේවාවක් වන්නේ,

1. මුදල් ඇණවුම් මාරු කිරීම.
2. විදුලි බිල්පත් ගෙවීම.
3. චෙක්පත් මාරු කිරීම.

**52.** '' සිරිත් '' ලෙස හඳුන්වන්නේ,

1. අප විසින් නොකළ යුතු අයහපත් ක්‍රියා ය.
2. අප විසින් සිදු කළ යුතු යහපත් ක්‍රියා ය.
3. අප විසින් සිදු කළ යුතු , නොකළ යුතු ක්‍රියා ය.

**53.** හින්දු ආගම හා සම්බන්ධ ආගමික උත්සවයකි.

1. මහ සිකුරාදා 2. තෛපොංගල් 3. හජ්ජි


**54.** ශාක පත්‍ර පමණක් යොදාගෙන තම වාසස්ථාන සාදා ගන්නේ,

1. කපුටා 2. කොවුලා 3. ඩිමියා

**55.** " රත්න දීප ජන්ම භූමි " ගීතය,

1. නැළවිලි ගීයකි　　2. දේශාභිමාන ගීයකි　　3. ජාතික ගීයකි

**56.** මෙම පරීක්ෂණය මගින් සිදු කරනු ලබන්නේ,



1.ජලයේ ඝනත්වය බැලීම.

2. ජලයේ පීඩනය බැලීම.

3. ජලයේ වේගය බැලීම.

**57.** සීගිරිය පිහිටි පළාත වන්නේ,

1. උතුරු මැද පළාත　　2. නැගෙනහිර පළාත　　3. මධ්‍යම පළාත

**58.** මැටිවලින් සිය වාසස්ථානය සාදා ගන්නේ,

1. වඩු කුරුල්ලා　　2. වැහිලිහිණියා　　3. කිරලා

**59.** කෘමි සතෙකු විය නොහැක්කේ,

1. මදුරුවා　　2. මී මැස්සා　　3. මකුළුවා

**60.** ජාතික කොඩියේ සහ රාජ්‍ය ලාංඡනයේ යන දෙකෙහි ම දැකගත හැකි සංකේතයකි.

1. ධර්ම චක්‍රය　　2. කඩුව අතින් ගත් සිංහයා　　3. පුන්කලස

(1x30=30)

පැහැදිලි හා නිවැරදි අත් අකුරු සඳහා ලකුණු 02ක් හිමි වේ.